ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
**NATIONAL EVALUATION AND TESTING SERVICE**

පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்ல.
**Pelawatta, Battaramulla.**

දුරකථන අංක / தொலைபேசி / Telephone: 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206, 2787207

ෆැක්ස් / பெக்ஸ் / Fax: 0112785220

තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS: තැ.පෙ. 1503 කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O. Box 1503 Colombo

අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Web Address: www.doenets.lk, www.results.exams.gov.lk

e-mail: exams@doenets.lk

මගේ අංකය / எமது இல / My No.: 1/1/මාධ්‍ය නිවේදන/2021

ඔබේ අංකය / உமது இல / Your No.: ......................

දිනය / திகதி / Date: 2021.11.09

---

**සියලු ම මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,**

පහත සඳහන් නිවේදනය ඔබ විද්‍යුත් / මුද්‍රිත මාධ්‍යයෙහි ප්‍රචාරය කිරීමට / පළ කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මේ පිළිබඳව ඔබෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

# මාධ්‍ය නිවේදනය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021

### අයදුම් පත්‍ර කැඳවීමේ දින දීර්ඝ කිරීම.

### සහ

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020

### සෞන්දර්යය ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම.

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා කඩඉම් ලකුණු ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වූ සිසුන් විශාල ප්‍රමාණයක් නැවත අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටීම සඳහා අවස්ථාව සලසන ලෙසට සිදු කරන ලද ඉල්ලීම් හේතුවෙන්, අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටීම සඳහා වන අයදුම් පත්‍ර කැඳවීම **2021.11.10** දින සිට **2021.11.20** දින දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

02. ඒ අනුව, මාර්ගගත (Online) ක්‍රමයට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවි වන www.doenets.lk හෝ www.onlineexams.gov.lk/eic හෝ දෙපාර්තමේන්තු නිල ජංගම දුරකථන යෙදවුම(Mobile App) "DoE" වෙත පිවිස අදාළ **උපදෙස් හොඳින් කියවා ඒ අනුව ම නිවැරදිව** මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ අයදුම් පත්‍ර යොමු කළ යුතු වේ.

03. උක්ත විභාගය සඳහා **රජයේ පාසල් සිසුන්** අදාළ පාසලේ විදුහල්පතිවරුන් වෙත දැනටමත් ලබා දී ඇති පරිශීලක නාමය (User name) හා මුරපදය (Password) භාවිතයෙන් අයදුම් කළ යුතු වේ. **පෞද්ගලික අයදුම්කරුවන්** පෞද්ගලිකව ම අදාළ උපදෙස් අනුව මාර්ගගත ව අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු වේ. ඉන් අනතුරුව එහි මුද්‍රිත පිටපතක් ලබා ගෙන අවශ්‍ය අවස්ථාවක දී ඉදිරිපත් කිරීමට තමන් භාරයේ සුරක්ෂිතව තබා ගත යුතු ය.

04. තව ද, 2020 අ.පො.ස.(සා.පෙළ) විභාගයේ සෞන්දර්යය විෂයයන්වලට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ **2021.12.01** දින සිට **2021.12.11** දින දක්වා පැවැත්වීමට ද කටයුතු සිදු කරමින් පවතින බව නිවේදනය කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්